# ඊ - වාණිජ්‍ය සංකල්පය හා අන්තර්ජාල ව්‍යාපාර

01. Neo - lanka සමාගමේ නව ශාඛාවක් මාතලේ නගරය කේන්ද්‍රකර ගෙන විවෘත කිරීමට යෝජිතය. එහි ප්‍රවර්ධන කාර්යයන් අන්තර්ජාලය මගින් පමණක් සිදු කිරීමට කළමනාකාරිත්වය තීරණය කරයි. එහි දී ඔවුන් තොරතුරු තරැව්කරුවන් (Information Broker) යොදා ගැනීමට නියමිතය.

1. තොරතුරු තරැව්කරුවන්ගේ කාර්යය පැහැදිලි කරන්න.

2. අන්තර්ගතය සපයන්නන් (content provider) මගින් සිදු කරන්නේ කුමන ආකාරයකට අදාල කාර්යයක් දැයි පැහැදිලි කරන්න.

3. අතත්‍ය වෙළඳ ප්‍රදර්ශනාගාර (Virtual Store Front) ක්‍රියාත්මක වන්නේ කුමන ආකාරයකට අදාළව ද?

4. වෙළඳ සංවිධානයක පවතින ලක්ෂණ මොනවාද ?

5. අන්තර්ජාලයේදී අතත්‍ය ප්‍රජාව (Virtual Community) මගින් සිදු කරන ක්‍රියාකාරකම් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

02. Covid 19 රටපුරා පැතිරයාම නිසා ව්‍යාපාර බැංකු හා රජයේ කාර්යාල සියල්ල වසා දමා තිබේ. නිලුක්ෂණගේ මෝටර් කාරයේ ආදායම් බලපත්‍රයේ වලංගු කාලය අවසන් වී ඇත. ඔහුට ආදායම් බලපත්‍රය අළුත්කර ගැනීමට ඉ වාණිජ්‍ය තුලින් හැකියාව ඇති බව රුවන් පවසයි.

1. ඔහුට එම සේවාව ලබාගැනීම සදහා යොදා ගත හැකි ඉ වාණිජ්‍ය වර්ගය නම් කරන්න.

2. ඉ වාණිජයට අයත් පහත සේවාවන් මගින් ලබා දෙන කාර්යයන් නම් කරන්න.

G2B

B2B

3. මෙවැනි අවදානම් සහගත අවස්ථා වලදී ව්‍යාපාර ආයතන හට තම කාර්යයන් සිදුකර ගැනීමට අන්තර්ජාලය යොදාගත හැකිය.

1. ව්‍යාපාර ආයතන මගින් යොදා ගන්නා ඉ වාණිජ්‍ය නම් කරන්න.

2. ඉහත නම් කරන ලද ඉ වාණිජ්‍ය වර්ගය මගින් ලබා ගත හැකි සේවාවන් මොනවා ද?

4. භාණ්ඩ මිලදී ගැනීමේ පහසු ක්‍රමයක් ලෙස මාර්ගගත වෙළඳපොල යොදා ගත හැකිය. මාර්ගගත වෙළඳපොල යොදා ගැනීම මගින් පාරිභෝගිකයාට ලැබෙන වාසි මොනවාද ?

03. (අ) අන්තර්ජාලය හරහා භාණ්ඩ අලෙවි කිරීම අද වන විට ප්‍රචලිත ක්‍රමයකි. ඒ සදහා සැකසුනු වෙබ් අඩවි ගණනාවක් පවතී. ඒවායේ අලෙවි කරන භාණ්ඩ පිළිබද විස්තර හා මිල ගණන් ප්‍රදර්ශනය කරයි. භාණ්ඩ මිලදී ගැනීමේ දී වෙබ් අඩවියේ ලියාපදිංචි වීම සිදුකළ යුතුය. අදාල භාණ්ඩ බෙදා හැරීම සදහා කුරියර් ආයතනයක සේවය ලබාගනියි. ඔවුන් භාණ්ඩ අදාළ පාරිභෝගියකයාගේ නිවසටම ගෙනවිත් ලබාදෙයි. අදාළ භාණ්ඩ සදහා මුදල් ගෙවීම ණය කාඩ්පත් හෝ හර කාඩ්පත් මගින් මෙන්ම භාණ්ඩ භාරදුන් පසුද මුදල් ගෙවිය හැකිය.

1. ඉහත ගනුදෙනුව සදහා භාවිතා කරන ඊ වාණිජ්‍ය වර්ගයන් මොනවාද ?

2. ඔබ හඳුනාගත් ඊ වාණිජ්‍ය වර්ගයන්ට අදාළ උදාහරණ ඉහත සිද්ධිය ඇසුරෙන් සපයන්න.

3. අන්තර්ජාලය යොදාගෙන සිදුකරන මෙවැනි ගනුදෙනු සඳහා මුදල් ගෙවිය හැකි ක්‍රම මොනවාද ?

(අ) පහත දැක්වෙන අවස්ථා අයත්වන්නේ අංකිත ව්‍යාපාර වලින් කුමන වර්ගයකට දැයි හඳුනාගෙන ලියන්න. එම ව්‍යාපාර වර්ගය තෝරා ගැනීමට හේතු වූ සාධකය කෙටියෙන් පැහැදිලි කරන්න.

| සිද්ධිය | ව්‍යාපාර වර්ගය | පැහැදිලි කිරීම |
|---|---|---|
| 1. MAS ආයතනය මුඛ ආවරණ (Face mask) නිෂ්පාදනයට අදාළ අමුද්‍රව්‍ය අන්තර්ජාලය ඔස්සේ Sugandi ආයතනය මගින් ලබා ගැනීම | | |
| 2. මලින්ද තම පියාගේ බෙහෙත් වට්ටෝරුව Whatsapp මගින් රාජ්‍ය ඔසුසැල වෙත යොමු කොට ඖෂධ නිවසටම ගෙන්වා ගැනීම | | |
| 3. සමන් තමා ඡන්දදායකයෙකු වශයෙන් 2020 වර්ෂයට අදාළව ලියාපදිංචි වී ඇත්දැයි මැතිවරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා දැන ගැනීම | | |
| 4. රුවන් ග්‍රැෆික් නිර්මාණ ශිල්පියෙකි. ඔහු තම රැකියාව සිදු කරනු ලබන්නේ අන්තර්ජාලය යොදා ගෙන ඔහුගේ නිවසේ සිටය. එසේම ඔහු කිසිදු ආයතනයක ස්ථිර සේවකයෙකු නොවන අතර ගෙවන මුදල අනුව කාර්යයන් තෝරා ගනියි. | | |
| 5. ජීවන්ත තමාට ඇතිවූ හදිසි මුදල් අවශ්‍යතාවක් නිසා වෙබ් අඩවියක දැන්වීමක් පල කොට තම ඉඩමක් විකිණීම | | |
| 6. විශ්ව 2019 වර්ෂයේ සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුවෙකි. ඔහු තම සාමාන්‍ය පෙළ ප්‍රතිඵලය විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් ලබා ගැනීම | | |
| 7. පවතින ඇදිරි නීති තත්වය හමුවේ සුපුන් තම නිවසට අවශ්‍ය භාණ්ඩ වර්ග කිහිපයක් Keels සුපිරි වෙළඳසැලේ වෙබ් අඩවිය මගින් ඇනවුම් කොට ණය කාඩ්පත මගින් අදාල බිල ගෙවයි. සුපිරි වෙළඳසැල මගින් අදාල භාණ්ඩ නිවසටම ගෙනවිත් ලබාදෙයි. | | |
| 8. ආයෝජකයෙක් ශ්‍රී ලංකවේ පවතින ආයෝජන ප්‍රවර්ධන කලාපයක් තුල නිමි භාණ්ඩ කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඒ අනුව ඔහු මාර්ගගතව රජය මගින් ලබාදෙන බදු සහන පිළිබඳව විස්තර ලබා ගනී | | |